# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2359/02 - 2023 නොවැම්බර් මස 20 වැනි සඳුදා - **2023.11.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ATU/LND/04/DO12/2.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/8/2017/PC/312.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 313D උග්ගස්හේන ග්‍රාම නිලධාරි වසමේ, විල්පිට ගමේ පිහිටි මාතර සර්වේයර් ජනරාල්ගේ කැඩැස්තර සිතියම් අංක 820478 හි පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කම්පටයමුල්ල; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 5-10 ක පමණ වයසැති මිශ්‍ර බෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; ප්‍රමාණය : හෙක්ටයාර් 0.1279.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 ජනවාරි මස 17 වැනි දින පෙ.ව. 10.00ට අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 ජනවාරි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියලු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

**නිරෝෂා එස්. ගමගේ,**
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0200




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාවයි

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : මීරි/ඉ/3/01/14/07.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2154/6 සහ 2019.12.16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී *ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1A හි සඳහන් කැඩැස්තර සිතියම් අංක 510242 කලාප 1 පත්‍ර 5 දරන පිඹුරේ කැබලි අංක 172 ඉඩම් කොටසෙ හි, ඉඩමේ නම "හීදියවල වැව" ලෙස සටහන් වේ. නමුත් මෙම ඉඩමේ නම ගොරකගහලන්ද සහ රුක්මල්ගොඩැල්ල ලෙස සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 172**

ඉඩමේ නම: ගොරකගහලන්ද සහ රුක්මල්ගොඩැල්ල; ඉඩමේ විස්තරය: වැව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඒ. ඒ. ධර්මදාස, උඩුඋල්ල, බාදුරාගොඩ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය : හෙක්ටයාර් 0.7899.

**ඩබ්. පී. ප්‍රසාද් ඉන්දික,**
ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2023 නොවැම්බර් මස 14 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 11 - 0201

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.